# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1925/44 - 2015 ජූලි මස 29 වැනි බදාදා - 2015.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 4/3/1/119(iv)/අතිරේක 2.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 729 එෆ් උස්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නාගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මු.පි.ක. 4511 දරන සැලැස්මේ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0013 ක් වූ පහත සඳහන් බිම් කැබැලි.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: පිටගොන්එලිය; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්න අය: රජය; මුල් හිමිකම් පාන්නා: ඊ. පී. වීරසේකර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0007.

**කැබලි අංකය 02**

ඉඩමේ නම: පිටගොන්එලිය; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්න අය: රජය; මුල් හිමිකම් පාන්නා: යූ. මුනසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015 ඔක්තෝබර් මස 12 වැනි දින පෙ. ව. 10.30 ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2015 ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඉඩමට ඇති තම අයිතිය සනාථ කිරීම සඳහා අදාල ඔප්පු, ප්ලෑන් හා අනෙකුත් ලියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.

විමල් ගුණතුංග,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
කළුතර.

2015 ජූලි මස 22 වැනි දින,<br>
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-383

---

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 10/3/1/3/67.<br>
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2014/HW/246.

“ මාතලේ - ඉලුක්කුඹුර - පල්ලේගම මාර්ගයේ අංක 2/8, පාලම (රත්තොට අන්තය) නැවත ඉදිකිරීම (අමතර ඉඩම් අත්කරගැනීම)” සඳහා පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, විහාරගම ග්‍රාම නිලධාරි වසමේ, කුඹුරේගම්මැද්ද ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් සහතික කරන ලද මා 1632 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කට්ටිය.

**කැබලි අංකය 3**

ඉඩමේ නම: සුදුගගවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: එස්. පී. ද සිල්වා මයා, නදී උයන, සුදුගගවත්ත, කළුදැවල, මාතලේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0120.

**කැබලි අංකය 5**

ඉඩමේ නම: සුදුගගවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: එස්. පී. ද සිල්වා මයා, නදී උයන, සුදුගගවත්ත, කළුදැවල, මාතලේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0077.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00 ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 සැප්තැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. එම්. ජී. බී. විජේබණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

2015 ජූලි මස 27 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-384

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.